**GMOA**
ESTABLISHED IN 1926
TU No. 291
**THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION**
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 2055415 / 0718552552
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

12/11/2013

මාධ්‍ය නිවේදනයයි

**රථ වාහන සැලසුම් වෙනස් කිරීමේදි වෛද්‍යවරුන්ට සහ රෝගින්ට රෝහල් වෙත යාමට ප්‍රමුඛතාව ලබා දිම.**

පොදු රාජ්‍ය මණ්ඩල රාජ්‍ය නායක සමුළුව හෝ මැයි දිනය වැනි අවස්ථාවල රථවාහන සැලසුම් තාවකාලිකව වෙනස් කිරීමට ලක්වේ. නව රථවාහන සැලසුම් ක්‍රියාත්මක කරනු ලබන්නේ බොහෝවිට පිට පළාත් වලින් නගරයට කැඳවනු ලැබූ පොලිස් නිළධාරීන් විසිනි. මොවුන් නියෝග ක්‍රියාත්මක කරනයේ නව රථවාහන සැලසුම් අනුව රෝහල් කරා ළඟා විය හැකි මාර්ග ගැන දැනුමක් නොමැතිවය.

වාහන සඳහාවන නිළ ලාංඡන සහිත වෛද්‍යවරුන්ගේ වාහන මෙවන් අවස්ථාවල කෙසේ හෝ රෝහල් කරා ළඟා වුවද, රෝගින් රැගෙන එන වෙනත් වාහන රෝහල් අවට මාර්ග වල බොහෝ වේලාවක් ගත කිරීමට සිදු වූ අවස්ථා වාර්ථා විය.

එබැවින් මේ තත්වය පිළිබඳ දැඩි අවධානයක් යොමු කර රථ වාහන පාලනයට යොදවන පොලිස් නිළධාරීන් දැනුවත් කරන ලෙස අප පොලිස්පතිතුමාගෙන් ඉල්ලා සිටිමු.

ස්තූතියි

වෛද්‍ය ඝමන් අබේවර්ධන
ලේකම්